# කාර්යය සාධන පත්‍රිකාව 6 ශ්‍රේණිය

## ❖ ඒකකය 1

- ඉතිහාසය හැඳින්වීම

1) ඉතිහාසය යනුවෙන් හඳුන්වන්නේ කුමක්දැයි දක්වන්න

2) ඉතිහාසය ඉගෙනගනු ලබන ක්ෂේත්‍ර 3ක් ලියා දක්වන්න

3) ඉතිහාසය පිළිබඳව දැනුම ලබා ගැනීමට උපකාරී වන සෑම දෙයක් ම හැඳින්වීමට භාවිතා කරන පොදු නාමය හඳුන්වන්නේ කුමන නමකින්ද?

4) ඉතිහාසය ඉගෙනීමට ප්‍රයෝජනවත් වන මූලාශ්‍රය දෙවර්ර්ගයකි ඒ මොනවාද?

5) ඔබ දන්නා සාහිත්‍ය මූලාශ්‍ර 2ක් ලියා දක්වන්න

6) ඔබ දන්නා පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර 2ක් ලියා දක්වන්න

7) ඉතිහාසය ඉගෙන ගැනීමේ ප්‍රයෝජන 2ක් ලියන්න

8) ඉතිහාසය සඳහා කාලය මැනගන්නා ක්‍රම 2ක් දක්වන්න

9) ශකවර්ෂ ක්‍රමය ආරම්භ වන්නේ කුමන රටේ ද?

10) පොළොව හාරා ලබා ගන්නා තොරතුරු හඳුන්වන නම කුමක්ද?

## පිළිතුරු

1) අතීත කාලයේ ජීවත් වූ මිනිසුන් ගැන තොරතුරු සොයා බලා ඒවා පැහැදිලි කිරීමයි

2) පොත්පත් වලින් , වැඩිහිටියන් මගින්, කෞතුකාගාර මගින්

3) මුලාශ්‍රය

4) සාහිත්‍ය මුලාශ්‍රය, පුරාවිද්‍යා මූලාශ්‍රය

5) දීපවංසය, මහාවංසය

6) පැරණි කාලයට අයත් භාණ්ඩ, ගොඩනැගිලි හා ඒවායේ සුන්බුන් ආදි දේ

7) (1) අතීතයේ සිදුවූ අද්දැකිම් මගින් ඒවායෙන් ලැබෙන ආදර්ශ වර්තමානය වඩා යහපත් කර ගැනීමට යොදා ගැනීම

(2) අප මුතුන් මිත්තන් ලැබූ ජයග්‍රහණත් ඔවුන් අසාර්ථක වූ අවස්ථා ගැන හොඳින් දැන ගැනීමෙන් වර්තමානයේ අපට පැමිණෙන අභියෝග ජය ගත හැකි වීම

8) ක්‍රිස්තු පූර්ව
ක්‍රිස්තු වර්ෂ

9) ඉන්දියාවේ

10) පුරාවිද්‍යාත්මක කැණීම්